# ඇත්දළ කැටයම් කලාව

**කථිකාචාර්ය චන්දන රෝහණ විතානාච්චි.**

ඉතා ඈත අතීතයේ සිට පැවත එන ප්‍රසිද්ධ කැටයම් මාධ්‍යයක් ලෙස ඇත් දළ තෝරාගෙන ඇත්තේ එහි දක්නට ලැබෙන විශේෂිත ගුණාංග කිහිපයක් හේතුවෙනි. එනම් ඉතා පහසුවෙන් ලබාගත හැකි දිස්නයකින් යුක්ත වීම ද, ආවුදවලින් කළ යුතු කාර්යයන්ට දක්වන කර්මන්‍ය භාවයද, සෘතු විපර්යාස ආදි කාලගුණික වෙනස්වීම්වලට ඔරොත්තු දීමේ හැකියාව ද, දිරායෑම ආදී ක්‍රියාවන්ට ඔරොත්තු දීම හා දුර්ලභ ද්‍රව්‍යයක් වීම ද යනාදි ගුණාංගයෝ ය.

ඇත් දළෙහි පිටත, ස්වභාවයෙන් ම පවතින ඔපයකින් යුක්ත ය. අඟල් 1/16 සිට 1/8 දක්වා වූ ඝනත්වයක් ඇති වැස්මකින් දළය සම්පූර්ණයෙන් ම වැසී තිබේ. කැටයම් සඳහා ගන්නා විටදී මෙම වැස්ම ඉවත් කරනු ලැබේ. දත්ත මජ්ජාව හෙවත් දළ මදයේ ඇති ඉතා සියුම් නාලිකාවල පවතින කාබනික ද්‍රව්‍යවල ඇති ඉටි ගතිය හේතුකොට ගෙන ඇත් දළ කැටයමට සුදුසු වන අතරම එයට ඔපයක් ද ගෙන දීමට හැකි ය. වසර දහස් ගණනක් ඉක්මවා යාමෙන් දළකඩ භාණ්ඩවල කුඩා ඉරිතැලීම් ඇති වුවද එය භාණ්ඩයේ ඔපයට හෝ රමණීය ස්වභාවයට හානියක් සිදු කරන්නේ නැත. පාෂාණ හා ලෝහ නිර්මාණවල මතුපිට මෙන් ඇත් දළේ මතුපිට ගොරෝසු වන්නේ හෝ පහසුවෙන් ක්ෂය වී යන්නේ නැත.

ඇත් දළ කැටයම් කලාව ලෝකයේ ප්‍රාග් ඓතිහාසික සමයේ සිට පැවති බවට සාධක තිබේ. මේ සම්බන්ධයෙන් වන පැරණිම සාධක, පුරා ශිලා යුගයට අයත් ප්‍රංශයේ "**ඩොඩොත්**" නම් ගුහාවෙන් හා ස්විස්ටර්ලන්තයේ ස්ථානයකින් හමුවී ඇත.



මේ ඇත්දළ කැබලිවල පිනිමුවා හා මැමත් හස්තියා කැටයම් කර තිබේ. ප්‍රංශයේ "**ග්‍රොටේ ඩු පපේ**" නම් ස්ථානයෙන් සොයාගෙන ඇති කාන්තා රුවක කොටසකුත් ප්‍රාග් ඓතිහාසික මානව නිර්මාණයකි. මෙලෙස ඇරඹුණු ඇත් දළ කැටයම් කලාව එක්තරා අවධියක ලෝකය පුරා ජනප්‍රිය කැටයම් කලාවක් ලෙස පැවති බව ලෝකයේ කෞතුකාගාර රාශියක ප්‍රදර්ශනය කරන විවිධ රටවලට අයත් ඇත් දළ කැටයම් භාණ්ඩ සාක්ෂි දරයි. මෙම ලිපියෙන්, ජපානය, චීන, ඉන්දියාවේ ඇත් දළ කැටයම් කලාව හා ශ්‍රී ලංකාවේ දළකඩ කර්මාන්තය පිළිබඳ විමර්ශනයක් කරනු ලැබේ.

**ජපානයේ ඇත් දළ නිර්මාණ:-**

ඇත් දළ කැටයම් කලාව ආරම්භයේ දී මොවුන් ඒ සඳහා ගුරුකොට ගනු ලැබුවේ චීන කලා සම්ප්‍රදයයි. නමුත් මොවුන් ශිල්පීය ක්‍රම හා කලාත්මක ලක්ෂණ අතින් චීනයට වඩා බොහෝ වෙනස් වූද, උසස් වූද ඔවුනටම ආවේණික වූ කැටයම් කලාවක් බිහි කරගන්නා ලදි. මෙම සම්ප්‍රදය ඉතා ඉක්මනින් ම "**කොතුගාවා**" රාජ අවධිය (ක්‍රි : ව : 1603 - 1867) තුළදි වර්ධනය විය. එකල විසූ දක්ෂ කැටයම්කරුවන් විසින් කළ නිර්මාණවලට වැදගත් ස්ථානයක් හිමි විය. මාළිගයට ඇත් දළ කැටයම් භාණ්ඩ සැපයූ පාරම්පරික මධ්‍යස්ථානය මුලින් ම "**කියෝතෝ**" වූ අතර, පසුව **තෝකියෝ** නගරය විය.

කොතුගාවා අවධියේ ජනතාවගේ ඇඳුමෙහි අත්‍යාවශ්‍යය අංගයක් වූ "**නෙත්සුකෙ**" නම් අලංකාර ඇත් දළ භාණ්ඩය කැටයම් කිරීම විශේෂ කලාවක් බවට පත් විය. බෙහෙත් හෙප්පු, දුම්කොළ හෙප්පු, අවන් පත් ආදිය ඉන පටියේ ඇමිණීම සඳහා මෙම උපකරණය භාවිත කරන ලදි.

ජපාන ඇත් දත් කැටයම් සඳහා ආගමික ජීවිතය, දේව කථා, පුරාවෘත, චාරිත්‍ර වාරිත්‍ර, වෘක්ෂලතා, දෛනික ජීවිතයේ සිදුවීම් යනාදි තේමාවන් උපයෝගි කරගෙන තිබේ. මෙම කැටයම් කලාව ආකෘතික වශයෙන් දැඩි ශෛලිගත භාවයක් සමඟ

තාත්වික භාවයක් ද නිරූපණය කරනු ලබයි. පූජාසන සැරසීම හා ගෘහ අලංකාර කිරීම පිණිස භාවිතා වූ ආගමික රූපවලින් යුක්ත "**ඔකිමොනෝ**" නම් විශාල ඇත් දළ නිර්මාණ තැනීම ජපානයේ දියුණු ම සම්ප්‍රදයකි.

**චීනයේ ඇත් දළ කලාව :-**

චීනයේ ඉතා අතීතයේ සිට ම ඇත් දත් කැටයම් කලාව එරට ව්‍යාප්තව පැවති බවට සාධක තිබේ. "**ෂාන්**" රාජසමයට අයත් ඇත් දළ කැටයම් භාණ්ඩ රාශියක් කැණීම් මගින් සොයාගෙන තිබේ. ඒ අතර කුඩා අලංකාර ඵලක, කොණ්ඩ කටු, සොහොන් සැරසීමට යොදාගත් කැටයම් සහිත ඇත් දළ කැබලි ද වේ. "**චෞ**" රාජ වංශයේ රජවරුන්ට (ක්‍රි : පූ : 1122 - 256) ඇත් දත් කැටයමින් අලංකාර කරන ලද රථ තිබී ඇත. ක්‍රි : පූ : 276 විසූ "**මෙං චාන් චූං**" නැමැති රජයේ උසස් නිලධාරියකුගේ නිවසේ අලංකාර භාණ්ඩ අතර ඇත් දළ කැටයමින් යුතු ඇඳක් විය. චෞ රාජ සභාවේ උසස් නිලධාරීන්ගේ ඇඳුම් වැදගත් කොටසක් වූ, "**හූ**" නමින් හැඳින්වුණ ඇත් දළ ස්මරණ පත්‍ර ඔවුන්ගේ නිල තත්වය හෙළි කිරීම සඳහා පදක්කම් ලෙස පළඳ තිබේ. මේ සිරිත ක්‍රි : ව : 1622 "**මිං**" රාජ වංශය බිඳ වැටෙන තෙක් ම පැවතුණි. මුලදී ධනවතුන් විසින් අලංකාර භාණ්ඩ ලෙස ඇත් දළ නිර්මාණ එකතු කරන ලදි.

"**තාං**" රාජ යුගයේ (ක්‍රි:ව: 618 - 906) නිර්මාණය කරන ලද ඇත් දළ මූර්තිවලට අනුව මේ කාලයේ දියුණු දළ කඩ කර්මාන්තයක් චීනයේ පැවති බව පැහැදිළි වේ. පැතලි ඇත් දත් කැබලි මතුපිට සායම් ආලේප කොට කුරුල්ලන්ගේ හා සිව්පාවුගේ රූපත්, ජ්‍යාමිතික සංලක්ෂණත් කැටයම් කිරීම මේ යුගය තුළ පැවති සම්ප්‍රදයකි. "**සුං**" රාජ යුගය (ක්‍රි : ව : 960 - 1279) කාලයේ දි නිමවන ලද ඇත් දත් රූප වර්ණ ගන්වා ද තිබේ.

**ඉන්දියාවේ ඇත් දළ නිර්මාණ:-**

මොහෙන්දජාරෝ නටඹුන් අතුරෙහි තිබී සොයා ගන්නා ලද ඇත් දත් වලින් කරන ලද "**චෞක්**" නැමැති ආභරණය ඇත් දළ කැටයම් කලාවට ඉන්දියාවේ දීඝී ඉතිහාසයක් තිබෙන බවට



සාධකයකි. ක්‍රිස්තු වර්ෂාරම්භය තුළ නිමවන ලද ගෘහභාණ්ඩ, ක්‍රීඩා භාණ්ඩ, ආභරණ ආදි දෛනික ජීවිතයේ භාවිතා කළ ඇත් දත් භාණ්ඩ සමූහයක් තක්ෂිලාවෙන් හමු වී තිබේ. මෙම භාණ්ඩ වැඩි කොටසක් ග්‍රීසියෙන් හෝ බටහිර ආසියාතික රටවලින් ගෙනෙන්නට ඇතැයි සර් ජෝන් මාර්ෂල් අදහස් කරයි. එහෙත් මෙම භාණ්ඩ අතර දේශීය ලක්ෂණවලින් යුත් භාණ්ඩ ද වේ. ශෛලිය හා චිත්‍ර සංලක්ෂය අතින් ඉන්දියානු ප්‍රභවයක් දක්වන ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසට අයත් කලාත්මක ඇත් දත් පනාව එවැන්නකි.

ක්‍රිස්තු වර්ෂාරම්භයට පෙර පවා ඉන්දියාවේ ඇත් දත් කර්මාන්තකරුවන්ගේ ශිල්පායතන පැවති බවට, සාංචි ස්තූපයේ පැරණිම තොරණ වූ දකුණු තොරණින් ඇති සෙල්ලිපියෙන් හෙළි වේ. මෙම තොරණ විදිසා නගරයේ ඇත් දත් කර්මාන්තකරුවන්ගේ ශ්‍රේණිය විසින් නිමකොට පූජා කරන ලැදූයි සඳහන් වේ.

ඇෆ්ගනිස්ථානයේ "**බේග්‍රම්**" නම් ස්ථානයෙන් ඉන්දියානු ලක්ෂණයන් ගෙන් යුත් ඇත් දත් කැටයම් භාණ්ඩ රාශියක් සොයාගෙන තිබේ. කුෂාණ රජවරු ග්‍රීස්ම සෘතුව ගත කරන ලද්දේ බේග්‍රම්හි තිබූ මාලිගක ය. මෙම භාණ්ඩවලින් වැඩි ප්‍රමාණයක් පීඨ, මංජුසා ආදි ගෘහභාණ්ඩ සැරසීමට යෙදූ බොරදම් හා ආයත චතුරස්‍රාකාර ඵලක වේ. ඉතා අලංකාර දර්ශන හා චිත්‍රයන් මෙම ඵලකවල නිර්මාණය කර ඇත. ඵලක කීපයක ජාතක කථාවන්හි අවස්ථාවන් දක්වා ඇත. අනිකුත් සියලුම ඵලකවල ලෞකික ජීවිතයට අදාළ කැටයමින් අලංකාර කොට තිබේ. ඒ අතර කාන්තාවන්, කෙළි සෙල්ලම් හා රාජකීයයන් ආදීන් ද වේ.

1937 සොයා ගන්නා ලද මකරෙකු පිට නැගී සිටින අල්පෝන්නත ස්ත්‍රී රූප තුනකින් යුත් ඇත් දළ නිර්මාණය මගින් ගංගා දෙවි දුව පිළිබඳ ඉන්දියානු සංකල්පය නිරූපණය වෙතැයි විශ්වාස කරනු ලැබේ. ඉන්දියාවේ සමහර ඇත් දළ නිර්මාණයන් තුළින් විටක විදේශිය ලක්ෂණ ද පිළිබිඹු වෙතත්, සාංචි අමරාවතී ශෛලීන්ට හා විශේෂයෙන් ම මථුරා ශෛලියට ළං වූ දේශීය ලක්ෂණ ඒවා තුළ දිස්වේ.

ගුප්ත හා පශ්චාත් ගුප්ත අවධියේදි ඇත් දත් කැයටම් කලාව දියුණුව පැවති බව ඉන්දියානු සාහිත්‍යයෙන් හෙළි වේ. පැරණි බ්‍රාහ්මණබාද් නගරය ලෙස හඳුනාගෙන ඇති ස්ථානයෙන් '10 වන සියවසට පමණ අයත් ඇත් දත් නිර්මාණ කිහිපයක් සොයගෙන තිබේ. මෙම මූර්තිවලින් වැඩි වශයෙන් ම නිරූපණය වන්නේ කාන්තාවය. වැඩි දෙනෙකුගේ එක අතකින් නෙළුමක් ද, අනෙක් අතින් සළුවක් ද ගෙන සිටින ආකාරය දක්වා තිබේ.

මයිසෝර්, ඊවන්කෝර්, ඔරිස්සා ආදි ස්ථානයන් හි කර්මාන්තශාලාවලදී නිමවුණු පසුකාලකයට අයත් ඇත් දළ කැයටම් රාශියකි. මෙම කර්මාන්තය සඳහා ද පැරණි ශිල්පීය ක්‍රම භාවිතා කර තිබේ. ලාක්ෂා ආලේප කොට ඇත් දළ කැයටම් අලංකාර කිරීම මේ කාලයේ දි ව්‍යවාහාරයට පැමිණි ශිල්ප ක්‍රමයකි. මේ ක්‍රමය දකුණු තන්ජෝර්, මයිසෝර් ප්‍රදේශවල භාවිතා වේ.

පසු කාලයේ උතුරු ඉන්දියාවේ ද ඇත් දත් කර්මාන්ත මධ්‍යස්ථාන බිහි වී ඇත. 18 වන සියවසේදි ඔරිස්සාවේදි නිමවනු ලැබූ ඇතැම් ඇත් දත් නිර්මාණවල කලාත්මක අගය ඉහළ තැනක් ගනු ලැබේ. සඳුන් ලීයෙන් කළ පුටු, හෙප්පු, සංගීත භාණ්ඩ ආදියෙහි ඇත් දළ ඔබ්බා කැටයම් කිරීම පංජාබයේ දියුණුව පැවති කර්මාන්තයකි. මෝගල් සම්ප්‍රදායෙන් ආභාෂය ලත්, විසිතුරු මල් ලියකම් යොද ඇත්දත් නිර්මාණය කිරීම 17 වන සියවසේ සිට උතුරු ඉන්දියාවේ ප්‍රචලිතව පවතී.

**ශ්‍රී ලංකාවේ ඇත් දළ කැටයම් කලාව :-**

ක්‍රිස්තු පූර්ව කාලයේ සිටම ලංකාවේ වැසියෝ ඇත් දළ කර්මාන්තය පිළිබඳව දන සිටි බවට වංශකථාවලින් පැහැදිලි වේ. මහාවංශයේ, ලෝහ ප්‍රාසාදය ගොඩනැගීම හා සම්බන්ධ විස්තරයේදි එම ප්‍රාසාදය මධ්‍යයේ තැම්පත් කරන ලද ඇත් දළ ආසනයක් හා විජිනි පතක් පිළිබඳ සඳහන් වේ (මහාවංශය පරි: 27, ගාථා 32-6). ජෙට්ඨතිස්ස රජු දවස ඇත් දළ කැටයම් ශිල්පය ඉහළ තත්වයක පැවති බවත් එම රජු ද එම ශිල්පයෙහි නිපුණයකු බවත් මහාවංශයේ සඳහන් වෙයි (මහාවංශය පරි. 37, ගාථා 101 -11).



පළමුවන පරාක්‍රමබාහු රජු විසින් කරවන ලද පොළොන්නරුවේ නන්දන නම් උයනේ ස්නානගාරවල ස්ථම්භ ඇත් කඳ කැටයම් පුවරුවලින් අලංකාර කර තිබූ බව චූලවංශයේ සඳහන් වේ. (මහාවංශය පරි.74). දහවන සියවසේ ලියූ දම්පියා අටුවා ගැටපදයේ ද, දොළොස්වන සියවසේ රචනා කරන ලද ධර්මප්‍රදීපිකාවේ ද දහතුන්වන සියවසට අයත් සද්ධර්මරත්නාවලියේ ද, දාහතරවන සියවසේ අනාගත වංශයේ ද, පළොස්වන සියවසේ රචිත සද්ධර්මරත්නාකරයේ ද ඇත් දළින් කරන ලද නොයෙකුත් නිර්මාණ පිළිබඳව සඳහන්ය. කෝට්ටේ යුගයේ සංදේශ කෘතිවල ඇතැම් වර්ණනාවන් හි ඉස්රුමත් රජ මාළිගාවන් පිළිබඳව විස්තර කිරීමේදි ඇත් දළ පුටු යනාදිය පිළිබඳව දක්වා තිබේ. ගම්පොළ යුගයේ සිව්වන බුවනෙකබාහු රජු දවස දකුණු ඉන්දියාවෙන් විවිධ ශිල්පාචාරින් ගෙන්වීමෙන් ඇති වූ කලාශිල්ප නවෝදය නිසා ඇත් දත් කර්මාන්තයේ ද විශේෂ දියුණුවක් ඇති වූ බව කිව හැකි ය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු ද, දළකඩ කැටයම් කලාව නගාසිටුවීමෙහි ලා මහත් වෙහෙසක් ගත්තා ලදි.

අතීතයේ සිටම ඇත් දළ කැටයම් කලාව පිළිබඳව සාහිත්‍යය හා ඉතිහාසගත මූලාශ්‍රවල සඳහන් වෙතත් දනට ලැබී ඇති පැරණි ම ඇත් දළ සාධකය වන්නේ රුවන්වැලිසෑයේ දකුණු වාහල්කඩින් හමු වූ, ඉනේ මුතුවැලක් පැළඳ සිටින නග්න ස්ත්‍රී රූපයයි. එහි වූ කලාත්මක ලක්ෂණ අනුව එය ක්‍රි : ව : 2 වන සියවසට පමණ අයත් බව පෙනේ. 1990 වර්ෂයේ දි මාතොට (මන්නායි) කරන ලද කැණීමේදි සියලුම අංගවලින් සමන්විත මගී ප්‍රවාහන කරත්තයක් හමු වී තිබෙන අතර, එය දනට කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කරනු ලැබේ.

ලංකාවේ පැරණි සිද්ධස්ථාන කීපයක කලාත්මක ඇත් දත් නිර්මාණ කිහිපයක් වේ. වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඩවිල්ලි හත්පත්තුවේ පිහිටි රිදී විහාරයේ තිබෙන සම්පූර්ණයෙන් ම ඇත් දළ කැටයමින් වැසුණු උළුවස්ස දනට ලංකාවේ තිබෙන විශාලම ඇත්දළ නිර්මාණය වේ. එය කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ නියෝගයෙන් තිබ්බොටුවාවේ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

වෙන කරවා පූජා කරන ලද්දකි. පළාපෙති, ලියවැල්, සත්ව රූප, මානව රූප ආදියෙන් අලංකාර කරන ලද මෙහි ඇති වැදගත් කැටයමින් යුතු තවත් නිර්මාණයක් වන්නේ ඇත් දළින් කරන ලද "**පංච නාරි පටයයි**." එය උළුවස්ස මුදුනට සවිකර තිබේ. මනහර ඇත් දත් කැටයමින් යුතු තවත් නිර්මාණයක් වන්නේ මහනුවර ශ්‍රී දළදා මන්දිරයේ උඩු මහලේ මහ උළුවස්සයි. එහි ඇති ඇත්දළ කර්මාන්ත 'බලවත්වල, බෝධිනාරායන බුවනෙකබාහු චිත්‍රාචාර්ය' යන රාජ පටබැඳි නමක් තිබූ "**කුඩා පටබැන්දා**" නම් ශිල්පියා විසින් කර තිබේ.

මාතර හිත්තැටිය රජමහා විහාරයේ තිබෙන විචිත්‍ර ඇත් දත් මණ්ඩපය ද පැරණි නිර්මාණයකි. මහනුවර මගුල් මඩුවේ පේකඩ අනුව සියුම් කැටයම්වලින් යුක්ත වූ මෙය පත්තිරිප්පුවේ ආකෘතියකි. මෙය කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් එම විහාරයට කරන ලද පරිත්‍යාගයක් බව කියවේ. මේ හැර අකුරැස්ස ගොඩපිටිය විහාරයේ තිබෙන තවත් ඇත්දළ මණ්ඩපයක් "**සරම් මුදලි**" නම් පුද්ගලයාගේ පරිත්‍යාගයකි.

1585 දී ලංකාවේ වැසියෙකු විසින් ගෝවේ ආර්ච් බිෂෝප්වරයාට ප්‍රදානය කරන ලද ඇත්දළ කුරුසියක් උසස් නිර්මාණයක් ලෙස සළකා, එය ස්පාඤ්ඤයේ අගරජු වෙත යවමින් එය අසිරිමත් නිර්මාණයක් වන බවත් එබැවින් එය, රජුගේ වටිනා වස්තූන් සමඟ තැම්පත් කර තබන ලෙසටත් ඉල්ලා සිටි බවටත්, පෝල් ඊ පීරිස් දක්වා ඇත.

බ්‍රිතාන්‍යයේ මියුනිච් කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කරන ලංකාවේ ඇත්දළ පෙට්ටි දෙකකින් වැදගත් දේශපාලන සිදුවීම් දෙකක් නිරූපණය වේ. මේ එක් පෙට්ටියක නිරූපනය වන්නේ කොට්ටේ යුගයේ රජකළ 7 වන බුවනෙකබාහු රජුගේ කාලයේ සිදු වූ වැදගත් සිදුවීමකි. එය ඉදිරිපස වම් කොටසේ තම සිංහාසනේ උරුමයට පුතෙකු නොසිටි බැවින් 7 වන බුවනෙකබාහු තම මුණුබුරු වූ ධර්මපාල කුමරුට පෘතුගාලයේ රජු ලවා ඔටුනු පැළඳවීම දක්වා ඇත. එහි කුඩා කුමාරයා පෘතුගාලය රජු ඉදිරියෙන් දක්වා තිබේ. සිංහල තානාපතිවරයා ධර්මපාල



කුමරුගේ අත පෘතුගාලය පෘතුගාල රජුගේ සුරතේ තබන අයුරු කැටයමට නගා ඇත. ඉදිරිපස දකුණු පුවරුවේ තුන්වන දෙන් ජුවාන් රජු ධර්මපාල කුමරුට ඔටුනු පැළඳවීම දක්වා තිබේ. එම පෙට්ටියේ පියනෙහි කැටයමකට සමුද්‍ර දේවිය ළදරු ධර්මපාල ඔසවාගෙන සිටින ලෙස නිමාවා ඇත. පසෙක සිටින කාන්තාව බුවනෙකබාහු රජුගේ බිසව විය හැකි ය. එහි තවත් කැටයම් රාමුවක රජුගේ දෙමළ-බිසවක් පෙන්නුම් කෙරේ. එය රජුගේ යකඩ දෝලිය බව පෙන්නුම් කිරීමට දො කෙටේරියක් සහ නෙළුම් මලක් දක්වා තිබේ. තවත් රාමුවක බුවනෙකබාහු රජු ඔටුනු පැළඳවීම දක්වන අතර, එහි සිංහාසනයේ දෙපස රජුගේ සොහොයුරන් වූ රයිගම් බණ්ඩාර හා මායාදුන්නේ සිටි.

එම කෞතුකාගාරයේ ම ඇති අනෙක් පෙට්ටියේ ද නිරූපණය වන්නේ තවත් දේශපාලන සිදුවීමකි. එහි ප්‍රධාන කැටයම් එලකයේ වම් පැත්තේ පෘතුග්‍රීසි හේවායන් අශ්වයින් පිට සිටිනු දක්වේ. මැද කොටසේ සිංහල හා පෘතුග්‍රීසි ප්‍රධානීහු වාඩි වී සිටිති. දකුණු පස කැටයමේ යුව රජ කෙනෙකු යැයි සිතිය හැකි පෘතුග්‍රීසි ජාතිකයෙකු තවත් හේවායන් දෙදෙනෙකු සමඟ අසුපිට යනු දක්වේ. මේ හැර නරියා හා කොකාගේ කථාව සිහිගැන්වෙන කැටයමක් මැද එලකයේ ඉහළින් යොදා තිබේ. එම පෙට්ටියෙහි පියන් පතෙහි නැටුම් දර්ශන තුනක් දක්වේ. පෙට්ටියේ පටු පැතිවල ඇතු පිටින් ගමන් කරන පිරිසකි. එයින් දක්වෙන්නේ තානාපති පිරිසක් කෝට්ටේ රාජධානියෙන් නික්මීම යැයි සිතිය හැකි ය. එහි අනෙක් පස සිංහාසනාරූඪව සිටින රජු දක්වේ. එහි දෙපස චත්‍ර ධාරීහු වෙති. මෙම කැටයම්වලින් දක්වෙන තේමාව 1541 දී පමණ කෝට්ටේ රාජධානියේ සිදු වූ සිදුවීමකි. මායාදුන්නගෙන් අනාගතයේ ඇතිවිය හැකි තර්ජන පිළිබඳව සළකා බැලූ හත්වන බුවනෙකබාහු රජු ගෝවේ පෘතුග්‍රීසි ආණ්ඩුකාරයා වෙත තානාපති පිරිසක් යවා අවශ්‍ය වූ විටෙක සහයෝගය ලබාගැනීම පිණිස ගිවිසුමක් ඇතිකරගත් බව ඉතිහාසයේ සඳහන් වේ. මෙම ඇත් දළ කැටයමින් නිරූපණය වන්නේ එම තානාපති ගමන යයි විශ්වාස කෙරේ.

ලංකාවේ ඇත් දත් කැටයම් අතර ඉතා සුලභව දක්නට ලැබෙන්නේ හිටි බුද්ධ ප්‍රතිමා ය. හිඳින හෝ සැතපෙන ඉරියව්වෙන් යුත් ඇත් දත් පිළිම බෙහෙවින් අඩුය. මහනුවර අස්ගිරියේ විජයසුදරාරාම රජමහා විහාරයේ තිබෙන ඇත්දත් පිළිමය ලංකාවේ ඇති ඇත්දළින් නෙළූ විශාල ම පිළිමය වේ. අභය මුද්‍රාවෙන් යුත් මේ පිළිමය දකුම්කළු ය. පරිමාව ද හොඳින් ගැළපේ. සිවුරේ පාරුපණය සමාන්තර රේඛා ඔස්සේ පහළට දිවේ. මුහුණේ ඉරියව් කදිමට නිරූපණය කොට දක්වා තිබේ. පිළිමය තැම්පත් කර තිබෙන පත්තිරිප්පු හැඩයෙන් යුත් අඩි 8 ක් පමණ උස් වූ අලංකාර මණ්ඩපය බුරුත හා කළුවර ලීයෙන් තනා තිබේ. එසේ ම එය රිදී හා ඇත්දත් කැටයමින් අලංකාර කොට තිබේ. කීර්ති ශ්‍රී රාජසිංහ රජු සිය මාළිගයේ වඩා හිඳුවා තබන ලද්දේ මේ පිළිමය යැයි විශ්වාස කරනු ලැබේ. මෙම පිළිමය කුඩා පටබැන්ද නම් ශිල්පියාගේ නිර්මාණයක් ලෙස සැලකේ.

වැලිවිට ශ්‍රී සරණංකර ස්වාමීන්ද්‍රයන් වහන්සේට සංඝරාජ පදවිය පිරිනමමින් කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් පූජාකරන ලද ඇත් දළ මිට සහිත දර්ශනීය විජිනි පත උන්වහන්සේගේ වෙනත් පරිහරණීත වස්තූන් සමඟ මල්වතු විහාරයේ වැලිවිට පන්සලේ සුරක්ෂිතව ඇත.

පැරණි විහාරස්ථානවල පුස්තකාලයන්හි තිබෙන සමහර පුස්කොළ පොත් කම්බා අලංකාර ලෙස ඇත් දළ පුවරු වලින් තනා තිබේ. ඇත් දළ පොත් කම්බා දුර්වල නොවූවත්, ඓතිහාසික අගයෙන් හා කාර්මික දක්ෂතාවයෙන් හෙබි පොත් කම්බා සහිත පුස්තක තුනක් මල්වතු මහාවිහාරයේ, රිදි විහාරයට අයිති පන්සලේ තිබේ. අඩි 2 1/2ක් , 2 ක් හා 1 1/2 ක් වශයෙන් දික් වූද, අඟල් 3 1/2 ක් පළල වූද මෙම පොත් කම්බාවල මල් ලියකම් ඉතා සියුම් වන අතර, සුදුසු තන්හි රන් මිණි මුතු ඔබ්බා ඇත.

ලංකාවේ බහුලව හමුවන ඇත් දත් නිර්මාණ අතර ප්‍රධාන වන්නේ බුදු පිළිමයයි. මේ හැරුණ විට කරඬු, වටාපත් මිටි, තල් අතු මිටි යනාදිය ද ඇත්දළින් නිමකර තිබෙන, බුදු සමය හා බැඳි



භාණ්ඩ වේ. එදිනෙද ජීවිතය හා සම්බන්ධ ඇත් දළ නිර්මාණ අතර ආභරණ, හෙප්පු, කණ්ණාඩි කොපු, කණ්ණාඩි රාමු, පිහියා මිටි, බුලත් වංගෙඩි, කිල්ලොටා, බෙහෙත් කාරක, කන් හැදි, නලා, පන්හිඳ කොපු, කේන්ද්‍ර කොපු, වැලිපත්, හැරමිටි, පනා, පදක්කම්, වළලු, මාලා කොණ්ඩ කූරු ආදි භාණ්ඩ රාශියක් වේ.

## ජාතික කෞතුකාගාරයේ තිබෙන තෝරා ගන්නා ලද ඇත්දළ නිර්මාණ කිහිපයක්.

### හිටි බුද්ධ ප්‍රතිමාව (15.44.309)

ඉතා ප්‍රසන්න පෙනුමෙන් යුතු බුද්ධ ප්‍රතිමාවකි. ප්‍රතිමාවේ සිරස් පත පැහැදිලි ය. හිසකේ අක්බඹරු සේයාවක් ගනී. විශාල කන්පෙති මැදින් සිදුරු කොට දක්වා තිබේ. අභය මුද්‍රාවෙහි දකුණත දක්වා ඇති අතර පිට අත්ලෙහි මලක් සහ වෘත්ත හතරක් නිර්මාණය කර තිබේ. ඇඟිලි පුරුක් මනාව දක්වා ඇති අතර නියපොතු ඉතා පැහැදිලිව හඳුනාගත හැකි ය. ගෙලෙහි රේඛා තුනකි. නාසය කදිමට උල්ව සිටින සේ නිර්මාණය කොට තිබේ. නෙත්, තොල්, නාසය හා නිකට මනා පරිමානුකූලව නිර්මාණය කොට තබේ. පහතට හෙලා ඇති වමතෙහි ද නියපොතු පැහැදිව දක්වා ඇත. ඌර්ණ රෝම ධාතුව පැහැදිලිය. සිවුර ඇඟටම ඇලී ගිය සේයාවක් දක්වයි. සිවුරේ පාරුපණය පහළට සිටින සේ සමාන්තර රේඛාවෙන් දක්වා තිබේ. චීවරයේ වාටිය ඉතාම හොඳින් දක්වා ඇත. සිවුරේ පිටුපස රැල්ල පාද දක්වා වැටෙන අතර වමත සිවුර හා සම්බන්ධකර තිබේ. සිවුරේ පට රැඳවීම උදෙසා වෘත්තාකාර ආසනය මත අන්නාසි මලක හැඩය ගත්, කුඩා පද්මයක් නිර්මාණය කොට තිබේ. මහල් තුනකට සිටින පරිදි නිමවන ලද වෘත්තාකාර ආසනය මත පිළිමයේ පාද කදිමට නිරූපණය කොට තිබේ. 17 සියවසට පමණ අයත් ලක්ෂණ මෙම බුද්ධ ප්‍රතිමාවෙන් පිළිබිඹු වෙයි.

### හිටි බුද්ධ ප්‍රතිමාව (එක්ස්. 183. 184)

වෘත්තාකාර පද්මාසනයක් මත නිර්මාණය කොට තිබෙන හිටි පිළිමයකි. ආසනය මහල් තුනකින් යුක්තය. සමස්තයක් වශයෙන් ගත්විට මෙම ප්‍රතිමාව වර්ණාලේපිත වන අතර ම කැඩී

බිඳී ගොස්ය. මෙම ප්‍රතිමාවේ මුහුණේ අංග කදිමට දක්වා තිබේ. විශාල කන්පෙති මැදින් සිදුරු කොට ඇත. ප්‍රතිමාවේ දකුණතෙහි අත්ල කොටස නොමැති ය. ආකාරය අනුව අභය මුද්‍රාවෙන් යුත් ප්‍රතිමාවක් ලෙස සැලකිය හැකි ය. සිවුරේ පාරුපණය සමාන්තර රේඛාවෙන් පහතට දක්වා තිබේ. මෙම ප්‍රතිමාවේ හිස කළු වර්ණයෙන් ද, ශරීරය දුඹුරු වර්ණයෙන් ද, සිවුර රතු වර්ණයෙන් ද, සිවුරේ වාටිය කහ වර්ණයෙන් ද දක්වා තිබේ. මහනුවර සම්ප්‍රදයට නෑකම් කියනු ලැබේ.

## බෝධි සත්ව රූපය (13.41.280)

මෙය ඉතා අලංකාර නිර්මාණයකි. මෙහි ඇති බෝධි සත්වවරයා පද්මාසනයක් මත වැඩ සිටී. හිස පිටුපසින් රශ්මි මාලාවක් නිකුත් වේ. මෙම බෝසත් රූපය මෛත්‍රී බෝසතුන්ගේ බව විශ්වාස කරනු ලැබේ.

ප්‍රතිමාව වටා ඇති මකර තොරන ගොඩනගා ඇත්තේ සෘජුකෝණාස්‍ර පද්මාසනයක් මත ය. ආසනයේ සියුම් දර බේරා තිබේ. මකර තොරණ පිහිටුවා ඇති කුළුණු දෙපස මුරට සිටින දේව රූප දෙකකි. කුළුණු මත දක්වා ඇති මකරුන් දෙදෙනා ඉතා විශිෂ්ඨ ලෙස නිර්මාණය කර තිබේ. කිඹිසි මුහුණ තේජස් ආකාරයෙන් නිරූපිත ය. එය දෙපස වැ ගෙන සිටින බ්‍රාහ්මණ රූප දෙකකි. ඔවුන් දෙදෙනා දෙපස තවත් දේවතා රූප දෙකක් වේ.

## චාමරය (08.131. 234)

ඇත්දළ කැබැල්ල ලියවා එහි මිට නිර්මාණය කර තිබේ. ඇත්දළ මිටේ රතු හා කළුවරණයෙන් ලාක්ෂාවලින් සියුම් රේඛා කොට දක්වා තිබේ. මෙ චාමරයේ පැරණි කෙඳි තවමත් සෑහෙන දුරට සුරැකී පවතී.

## සාන්ත අන්තෝනි සාන්තුවරයාගේ ප්‍රතිමාව

වෘත්තාකාර ආසනයක් මත සිටගෙන සිටින ඉරියව්වෙන් නිර්මාණය කර තිබේ. ප්‍රතිමාව තුළින් යුරෝපීය ලක්ෂණ පැහැදිලිව හඳුනා ගැනීමට පුළුවන. දුහුල් ලෝගුව පහතට කඩා



වැටෙන සේ නිර්මාණය කොට තිබේ. දකුණතේ උස සැරයටිකි. එහි මුදුනෙහි මලක් සහිත කොටසකි. වමතෙහි කුඩා දරුවෙක් සිටී. දරුවා දකුණු අත ඉදිරියට පානා ආකාරයෙන් නිර්මාණය කොට තිබේ. හිසකේ පිටුපසට සිටින සේ පීරා ඇති මෙම ප්‍රතිමාවේ උඩුරැවුල හා යටිරැවුල පැහැදිලිව දක්වා තිබේ.

## කරත්තය (28.42.416)

1950 වර්ෂයේ මාතොට කරන ලද කැනීමෙන් සොයා ගන්නා ලද විශිෂ්ඨ නිර්මාණයකි. වියගසේ බැඳ තබන ගමන් කරන ඉරියව්වෙන් යුත් ගොන් බාන ඉතාමක් ම සජීවී ආකාරයෙන් නිරූපිත ය. වම්පස ඇති ගොනගේ ඉදිරිපස දකුණු පාදයත්, දකුණුපස ඇති ගොනාගේ වම් පස ඉදිරිපාදයත් එසවා ඉදිරියට ගමන් කරන ආකාරය දක්වා තිබේ. ගොනුන් දෙදෙනාගේ ම නාස් ලණු හා කරලණු දක්වා තිබේ. මොල්ලිය සහිත මෙම ගවයින් ගේ අං උල්කර ඇති අතර වම්පස ගවයාගේ කන හා අඟ කැඩී ගොස් තිබේ. මෙම ගවයින් දෙදෙනා බැඳි වියගහ රඳවා ඇති බෝංලීය ශක්තිමත් ලෙස දක්වා තිබේ. බෝංලීය මැද, දෙපා දෙපසට දමා දක්වා ඇත්තේ කරත්තකරුවා ය. හිසෙහි තලප්පාවකි.

මෙම කරත්තයේ රෝද සතරකි. රෝද නොගැලවීම සඳහා ආරක්ෂිත පියවරද ගෙන තිබෙන අතර මඩ ආවරන පවා දක්වා තිබේ. මෙම කරත්තයේ වහල කොටස් තුනකින් නිර්මාණය කොට ඇත. වහලේ ඉදිරි කොටසින් කරත්තකරුවාට ආවරණය සලසා තිබේ.

කරත්තය ඇතුළත පුරුෂයෙකු හා ස්ත්‍රියක ද හිසෙහි තොප්පි පැළද සිටී. මෙහි බොහෝ විට විදේශීය ලක්ෂණ පිළිබිඹු වන බව කිවයුතුය. සෑම ස්ථානයක් ම කැටයමින් අලංකාර කොට තිබෙන අතර එය පැතලි ඇත්දළ පුවරුවක් මත ගොඩනගා තිබේ.

## කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ප්‍රතිමාව (32 . 3 . 116)

මහනුවර ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශණය කෙරෙන මෙම නිර්මාණය අලංකාර ලෙස කර තිබේ. රජුගේ වමතේ හෙල්ලයකි. දකුණත අභය මුද්‍රාවෙන් යුක්ත ය. තට්ටු තුනකින්

යුත් අලංකාර ඔවුන්ත රජුගේ ප්‍රතාපවත් භාවය වැඩි කරනු ලැබේ. රජු මාල හතරක් පැළඳ සිටි විශාලම මාලයේ භේරුණ්ඩ පක්ෂියා සහිත තැල්ලක් නිමවා ඇත. අෂ්ඨාශ්ට්‍ර මාලකයක් මත මෙම ප්‍රතිමාව නිර්මාණය කර තිබේ.

**රාජකීයයන් (මහනුවර කෞතුකාගාරය)**

භාණ්ඩ අංක එක්ස්, 223.15, එක්ස් 221.14, එක්ස් 222.16 යන ප්‍රතිමාවලින් පැරණි සිංහල රජවරුන් නිරූපණය වේ. එතරම් විශාල ප්‍රතිමා නොවේ. කුමන රජවරුන් ද යන්න හඳුනාගෙන නොමැත. භාණ්ඩ අංක එක්ස් 220.14 එක්ස් 219.16, එක්ස් 218.14 යන ප්‍රතිමාවලින් උඩරට ප්‍රභූ කාන්තාවන් හෝ රජ බිසෝවරුන් පිළිබිඹු වෙතැයි විශ්වාස කරනු ලැබේ. සරල මෙන් ම වාම් ය. මේ හැරුණු විට රාජකීයයන් ගේ ප්‍රතිමා ගණනාවක් කොළඹ හා මහනුවර ජාතික කෞතුකාගාර සතුව පවතී.

**කුඩා කරඬුව (39.235)**

ඉතාමත් ම අලංකාර ලෙස ලියවා නිර්මානය කරන ලද්දකි. පේසා වළලු තුනකින් යුක්ත ය. කොත් කැරැල්ල ඇත්දත් වන අතර කොත පිත්තලින් කර තිබේ. බඳ, හතරැස් කොටුව හා කොත පිත්තලින් අලංකාර කර තිබේ . අඟල් 8 ක් පමණ උසැති මෙම කරඬුව මහනුවර ජාතික කෞතුගාකරයේ ප්‍රදර්ශන කෙරේ. මේ හැරුණු විට තවත් කරඬු ගණනාවක් කොළඹ හා මහනුවර ජාතික කෞතුකාගාරවල ප්‍රදර්ශනය කෙරේ.

**ඇත්දත් පතේලය (25.33.176)**

මහනුවර ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරෙන මෙම පතේලයේ ලී කෙළියේ යෙදෙන කාන්තාවන් දෙදෙනෙකු කැටයමට නගා තිබේ. හිඩැස් පිරවීම සඳහා ලියවැල් මොස්තර යොදාගෙන ඇත. මෙම කාන්තාවන් ආභරණ සහිත ය. සමමිතික වූ මෙම පතේලය අඟල් 2 පමණ පළලින් යුක්ත වේ.



**ඇත්දළ මිට සහිත පිහිය (කෝ. 58.136)**

මෙහි තලය මදක් විශාල වේ. පිහිය සඳහා ඇත්දළින් කරන ලද මිට අලංකාර කරලීම උදෙසා ලියවැල භාවිතා කර තිබේ. එය මත පිත්තල තහඩු කොටස් අලංකාරය පිණිස සවිකර ඇත. පිහියේ මිට කෙළවර පිත්තල විල්ලුවකින් ආවරණය කර තිබේ. ඒ අසලම පිහිය ආරක්ෂා කරන දැවමය කොපුව වේ.

**ඇස් කණ්නාඩිය (06.212.213)**

ඇත්දළින් කරන ලද රාමුව සහිත කණ්නාඩියකි. එයට ඇත්දළින් ම කරන ලද කොපුවකි. කොපුවේ අලංකාරය පිණිස ලියවැල් රටාවක් කැටයමට නගා තිබේ.

**කණ්නාඩි කොපුව (18.14.381)**

මෙහි අලංකාරය පිණිස යොදා ඇත්තේ හංස පුටුවකි. හංස ජෝඩුවගේ මුවින් නික්මෙන ලියවැල පුවරුව පුරාම විහිදී යනු ලැබේ.

**විශාල කර බලන කණ්නාඩිය (13.49.280)**

ඉතා විශිෂ්ට නිර්මාණයකි. වෘත්තාකාර කාචය සවිකර ලීම සඳහා ඇත්දළින් රාමුව නිර්මාණය කොට තිබේ. අල්ලා ගැනීමට යොදා ඇති මිට ද ඇත්දළ වේ. එම කොටස ලියපතක ආකාරයක් ගන්නා ලද ලියවැල් රාවකින් අලංකාර කර තිබේ.

**ඇත්දත් කත් හැන්ද (10.108.255)**

මකරෙකුගේ රුව රැගත් අලංකාර කත් හැන්දකි. මකරාගේ වලිගය කෙළවර හැඳි කොටස සාදා තිබේ. වලිගය ලියවැලක ආකාරය ගනී. මුළු කත් හැන්දම රිද්මයානුකූල වේ. මකරාගේ පාද අසල කොටසින් එල්ලා ගැනීම පිණිස ඇත්දළ රවුමක් යොදා තිබේ. මකරාගේ මුවින් ගිනි දැල්ලක් නික්මෙන ආකාරය හඳුනාගත හැකි ය.

**ඇත්දත් කන් හැන්ද (10.109.255)**

හංස ජෝඩුවක් කැටයමට නගා තිබේ. තොළින් තොල බැදී සිටින ආකාරයට නිර්මාණය කොට තිබේ. කන් හැන්ද රඳවා ගන්නා සිදුර ඉහළින් සිටින පක්ෂියාගේ පෙඳෙන් නිර්මාණය කොට තිබේ. යටින් සිටින පක්ෂියාගේ පෙඳෙන් හැන්ද නිමවා තිබේ.

**මකර තොරණ සහිත බෝසත් රුව.**

අඟල් 41/2ක් පමණ පළලකින් යුත් මෙම නිර්මාණය විශිෂ්ඨ කෘතියකි. මකර තොරණ යට යෝගාසන ඉරියව්වෙන් වැඩ සිටින බෝසත් රුවෙහි දකුණත භූමිස්පර්ෂ මුද්‍රාවෙන් යුක්ත වේ. හිස වටා රැස් වළල්ලක් ඇති අතර ජටා මකුටය අලංකාර ලෙස නිමවා ඇත. සම්පූර්ණයෙන් ම බොසත් රුව ආභරණයෙන් සරසා තිබේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


01. මහවංශය - රත්නාකාර පොත් වෙළඳ හල, 1967.

02. ඇත්දත් කර්මාන්තය - සිංහල විශ්ව කෝෂය, කාණ්ඩ 3, 1967, 82-91, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.

03. Ivories - The Encyclopedia Amaricana, vol 15, 1959: 563 - 7

04. Ivory Carrving - The New Encyclopedia Britanica Vol 6, 1976, 443-4

05. Irory and Ivory Carving - Colliers Encyclopedia vol 13, 1984, 410-11

06. Maskell, William - A Description of the Ivories. 1872, Ancient and mediaeval in the sooth Kensington musieaum, London

07. The Story a Casket Tells - 'The Island' 22nd March 1994: p4 Upali Newspapers Ltd. Colombo -13


(කොළඹ හා මහනුවර ජාතික කෞතුකාගාරයන්හි කරන ලද පර්යේෂණ කටයුතු සඳහා කෞතුකාගාර අධ්‍යක්ෂ සිරිනිමල් ලක්දුසිංහ මහතාගෙන් හා එම කාර්‍ය්‍ය මණ්ඩලයෙන් ලැබුණ සහය අගය කොට සලකමි.)